නෝර්වුඩ් ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 අප්‍රේල් 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 06 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස 09 සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (I) | සභාව වෙත පවරා තිබුණු ඉඩම් හා ගොඩනැගිලි 24 ක සහ ටේලර 02 වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී වටිනාකම් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (II) | අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් වත්කම් හා බැරකම් පැවරීමේදී රු.24,972,250 ක ආපසු ගෙවිය යුතු තැන්පත් පවරා ඇතත් එම වටිනාකමට සමාන මුදල් ලබාදී නොතිබුණු අතර, එම මුදල ලැබිය යුතු ශේෂයක් ලෙසටද ගිණුම්ගතකර නොතිබුණි | ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරි විගණන හා කළමනාකරණ කමිටුවකදී තීරණ ලබාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (III) | 2018 දෙසැම්බර් 28 දින නව පළාත් පාලන ආයතනවලට අවශ්‍ය පහසුකම් සැපයීම යටතේ පළාත් සභා සහ පළාත් පාලන | මුදල් ගෙන්වා ගෙන භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | මුදල් ගෙන්වාගෙන කටයුතු කරන බව. |

අමාත්‍යාංශයන් වෙන්කර තිබූ ප්‍රතිපාදන වෙනුවෙන් රු.3,412,780 ක්වූ බිල්පත් අමාත්‍යාංශය වෙත යවා තිබුණද මුදල් ප්‍රතිපාදන හෝ භාණ්ඩ 2019 අප්‍රේල් දක්වා සභාවට ලැබී නොතිබීයදි එම මුදල් තොග සහ ණයහිමි ගිණුම්වලට සටහන්කර තිබුණි.

1.4 අනුකූල නොවීම්
-------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

| | නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූල 2008 ජනවාරි 25 දිනැති අංක 1523/ 16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන/ අළුත් කරගෙන ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යායුතු ව්‍යාපාර 65 ක් සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | අදාළ ව්‍යාපාර සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට බලපත්‍ර නිකුත් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. |
| (ආ) | <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන )රීති</u><br>රීති 179 | සභාපතිවරයාගේ පරිහරණය සඳහා කුලී පදනම මත ලබාගත් වාහන වෙනුවෙන් රු.901,361 ක් ගෙවා තිබුණද, ගිවිසුමකට ඇතුළත්වී නොතිබුණි. | ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| | රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කළ යුතුවේ. | ඉදිරියේදී සමීක්ෂණය කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව 2010 වර්ෂයට පසුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී තක්සේරු කිරීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,981,663 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

(අ) ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------------

2018 අප්‍රේල් 01 දින ස්ථාපිත කර තිබූ සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවයක කාල පරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,288,500 | 1,634,599 | 1,642,112 | 1,021,319 |
| කුලී | 1,712,180 | 5,517,280 | 5,858,196 | 2,447,368 |
| බලපත්‍ර ගාස්තු | 1,530,000 | 660,500 | 660,500 | - |
| වෙනත් ආදායම් | 4,590,000 | - | 135,382 | - |
| | 11,120,680 | 7,812,379 | 8,296,190 | 3,468,687 |

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,661,000 ක එක්වන් (Key Money) මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට වහාම කටයුතු කළ යුතුය. | මුදල් අයකර ගනිමින් පවතී. |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.549,762 ක උසාවි දඩ හා රු.500,000 ක මුද්දර ගාස්තු අයකර නොතිබුණි. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ උපලේඛන ගෙන්වාගෙන අයකර ගැනීමට කටයුතු කරමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 03 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු කාරණාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැසට් කිරීමට කටයුතු කළ යුතුවේ. | දැන්වීම් පුවරු සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළකර ඇත. ඉතිරි ව්‍යවස්ථා 02 ඉදිරියේදී ගැසට් කිරීමට කටයුතු කරමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමි. |

(ඈ) අතහැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ)අඹගමුව ප්‍රාදේශීය සභාව විසින් රු.9,045,317 ක් වියදම් කොට අර්ධ වශයෙන් ඉදිකර තිබුණු නෝර්වුඩ් ආදාහනාගාරය සභාව වෙත පවරා තිබුණද ඉන්පසු කිසිදු කාර්යක් ඉටුකර නොතිබීම හේතුවෙන් විනාශයට ලක්වෙමින් පැවැතුණි. | හැකි ඉක්මනින් ඉදිකිරීම් සම්පූර්ණ කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදානාගාරය ඉදිකිරීමට අදාළ ගොනුව අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් ලබාගෙන ඉදිරි කටයුතු කරමි. |
| (ආ) වටිනාකම රු.95,000 ක් වූ ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක නොකර අතහැරදමා තිබුණි. | සැළසුම්කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට කටයුතු කළ යුතුවේ. | සභාවට පාලනය කළ නොහැකි හේතු නිසා මෙම ව්‍යාපෘති 02 ක්‍රියාත්මක කළ නොහැක. |

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී බලප්‍රදේශයේ විධිමත් කසළ කළමනාකරණයක් සිදුකර නොතිබුණි. බගවන්තලාව නගරයේ කසළ බැහැර කරනු ලබන ඉඩමේ මිශ්‍ර කසළ දිනපතා පුළුස්සන බව, සහ නෝර්වුඩ් නගරයේ ස්ථාන කීපයක මිශ්‍ර කසළ පුළුස්සමින් තිබුණි. | විධිමත් කසළ කළමනාකරණයක් සිදුකළ යුතුවේ. | අදාළ නිළධාරීන්ට උපදෙස් දී ඇති අතර ඒ සම්බන්ධයෙන් අධීක්ෂණය කරමි. |

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුලදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී තිරසර සංවර්ධන හා ඉලක්ක සපුරා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී කටයුතු කරමි. |

3.2 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2018 පෙබරවාරි 26 හා මැයි 17 දිනවල අනුමතකළ කාර්ය මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දින වන විට තනතුරු 20ක පුරප්පාඩු 79 ක් පැවතුණි. | හැකි ඉක්මනින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවති. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| බගවන්තලාව සහ පුලියාවත්ත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන 2018 මැයි 27 න් පසුව වසාදමා තිබුණු අතර, එම හේතුව නිසා බලප්‍රදේශයේ ජනතාවට ආයුර්වේද ප්‍රතිකාර ලබාගැනීම සම්පූර්ණයෙන්ම ඇනහිට තිබුණි. ආයුර්වේද සංස්ථාවෙන් වාර්ෂිකව ලැබී තිබූ රු.240,000 ක් වටිනා ඖෂධ තොගය සභාව විසින් දැනට දැනට භාවිතයට නොගන්නා රියදුරු නිල නිවසේ ගබඩාකර තිබුණි. | වෛද්‍ය නිළධාරියෙකුගේ සේවය ලබාගෙන වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුවේ. | දැනට වෛද්‍ය නිළධාරියෙකු නොමැති අතර පළාත් පාලන සහකාර කොමසාරිස් තුමා විසින් ඉල්ලීමක් කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් පවරාදෙන ලද ඉඩම් කැබලි 28 න් 26 කට අදාළ ඔප්පු සහ, කැබලි 24 කට අදාළ පිඹුරුපත් සභාවේ නොතිබුණි. ඉඩම් කැබලි 20 ක වපසරිය හඳුනාගෙන නොතිබුණි. | අදාළ ඉඩම් සඳහා ඔප්පු සහ වපසරිය හඳුනාගෙන පිඹුරුපත් සකස්කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කරමි. |

3.5 නිශ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පුලියාවත්ත කාර්යාල ඉඩමට යාබදව පර්චස් 40 ක පමණ වපසරිය සහිත රවීන්ද්‍රන් ළමා උද්‍යානය , හොන්සි - පුලියාවත්ත කැලි කසල ගබඩා මධ්‍යස්ථානය, බගවන්තලාව සෝගාතක ඉඩම , බගවන්තලාව කසළ වැළලීම සඳහා සහ සුසාන භූමිය සඳහා කොටියාගල වත්තෙන් මිලදීගත් ඉඩමේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ල, නෝර්වුඩ් එළුමස් කඩය හා ඉඩම සහ නෝර්වුඩ් සේවා කාමරය හා ඉඩම ප්‍රයෝජනයට නොගෙන අතහැර දමා තිබුණි. | ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී අදාළ කටයුතු සිදු කරමි. |

3.6 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (ආ) | වාහනවල අවසන්වරට ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ දිනයක් විගණනයට අනාවරණය නොවීය. | චක්‍රලේඛ ප්‍රකාරව වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කළ යුතුවේ. | ඉදිරියේදී සිදු කරමි. |
| (ආ) | අඹගමුව ප්‍රාදේශීය සභාවෙන් පවරාදුන් වාහන සභාවේ නමට ලියාපදිංචි කිරීමට කටයුතුකර නොතිබුණි | අදාළ වාහන සභාවේ නමට ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරමි. |

3.7 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට අදාළව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී සභාව සතු පුස්තකාල 04 හි රු.262,178 ක් වටිනා පොත් 2056 ක ඌනතාවයක් පැවතුණි. | ඌණතාවයන් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටුවේ තීරණය ලබාගෙන |

| | | |
|---|---|---|
| | | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

3.8 ප්‍රසම්පාදනය

--------------

3.8.1 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කර්මාන්ත 06 ක ගිවිසුම්ගත මුදල යටතේ නාම පුවරු සවිකිරීම සඳහා රු.10,000 ක් බැගින් මුදල් වෙන්කර තිබුණද අදාළ නාම පුවරු සවිකර නොතිබුණි. | අදාළ දැන්වීම් පුවරු සවි කිරීමට කටයුතු කළ යුතුවේ. | නාම පුවරු ගෙවා ඇති මුදල එම සමිති වල රුඳවුම් මුදල් වලින් හිලව් කිරීමට කටයුතු කරමි. |
| (i). ටිලරි පහළ කොටස ජල යෝජනා ක්‍රමය යටතේ වැඩ විෂය අංක 14 යටතේ කරාම කණු (Stand Post) 19 ක් සැකසීම සඳහා රු.36,005ක් ඇස්තමේන්තුකර, කරාම කණු 09 ක් ඉදිකර ඇති බවට ගෙවීම සඳහා බිල්කර තිබුණි. නමුත් 2019 ජනවාරි 28 දින වන විටත් අදාළ කරාම කණු ඉදිකර නොතිබුණි. | අදාළ ඉදිකිරීම් සම්පූර්ණ කළ යුතුවේ. | අදාළ කොනත්‍රාත්කරු වෙත දැනුම් දී ඇත. එසේ නොවුනහොත් සභාව විසින් ආදාළ අඩුපාඩුව නිමකර රුඳවුම් මුදල සභාව සතු කර ගැනීමට කටයුතු කරමි. |
| (ii). වැඩ විෂය අංක 15 යටතේ 1 ½ " ජී.අයි බටවලින් ජලනල සඳහා ආවරණ යෙදිය යුතු වුවත් අදාළ ආවරණ යොදා නොතිබුණි. | අදාළ ඉදිකිරීම් සම්පූර්ණ කළ යුතුවේ. | අදාළ කොනත්‍රාත්කරු වෙත දැනුම් දී ඇත. එසේ නොවුනහොත් සභාව විසින් ආදාළ අඩුපාඩුව නිමකර රුඳවුම් මුදල සභාව සතු කර ගැනීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1. අයවැය පාලනය

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අනුව ඉදිරිපත් කළයුතු අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදු වී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදී මෙම විචලනය පාලනය කර ගනිමින් ස්ථිර මට්ටමේ අයවැයක් සකස් කර ගැනීමට කටයුතු කරමි. |

4.2. අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | නිළධාරීන්ගේ පුරප්පාඩු පැවති නිසා අභ්‍යන්තර විගණනය සිදු කළ නොහැකි අතර ඉදිරියේදී මෙම විෂය සඳහා නිළධාරියෙකු යෙදවීමට කටයුතු කරමි. |

4.3 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුව එක් වරක් පමණක් පවත්වා තිබුණි | ඉදිරියේදී විගණන හා කළමනාකරණ කමිටු නියමිත පරිදි පැවැත්විය යුතුවේ. | ඉදිරියේදී නියමිත පරිදි පැවැත්වීමට කටයුතු කරමි. |